# ලංකා බැංකුව

විදේශ රටවල සහ දිවයින පුරා දිවෙන පුළුල් ශාඛා ජාලයක් සහිත ලොව ප්‍රමුඛපෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව මෙන්ම40 ලංකාවේ අංක 01 බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුර සඳහා පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ඉංජිනේරු III වන ශ්‍රේණිය (සිවිල්)

### 1. යෝග්‍යතා නිර්ණායක

ශ්‍රී ලාංකිය පුරවැසියකු විය යුතුය.

**1.1. සුදුසුකම් සහ පළපුරුද්ද**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් (ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ) ලබා ගත් විද්‍යාවේදී ඉංජිනේරු (සිවිල්) උපාධියක් හෝ ඊට සමාන උපාධියක් සමග ගොඩනැගිලි ඉදිකිරීම, අලුත්වැඩියාව හා නඩත්තුව සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ වසර 2ක පළපුරුද්ද

හෝ

තාක්ෂණවේදය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (National Diploma in Technology) හෝ ඊට සමාන සුදුසුකමක් සමග ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තුව සහ අධීක්ෂණය පිළිබඳ වසර 5ක පළපුරුද්ද

➢ **වෙනත් සුදුසුකම්**

- අවම අධීක්ෂණය යටතේ සේවය කිරීමේ හැකියාව.
- කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස සේවය කිරීමේ හැකියාව.
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය
- පරිගණක සාක්ෂරතාව
- ස්වයං අභිප්‍රේරිත බව සහ බැංකුවේ අරමුණු සාර්ථක කරගැනීමට කැපවීමේ හැකියාව.

**1.2. වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ක් හෝ ඊට අඩු විය යුතුය.

### 2. පොදු නියමයන් හා කොන්දේසි

➢ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවයට පරිබාහිර (සංවෘත සේවය) වේ.

➢ පරිවාස කාලය වසරක්(01) වන අතර පරිවාස කාලසීමාව තුළ බැංකුව සෑහීමට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීම මත ඉංජිනේරු - III වන ශ්‍රේණිය (සිවිල්) ලෙස බැංකු සේවයේ ස්ථිර කරනු ලැබේ.

➢ තනතුරට අදාළ වැටුප් පරිමාණය:

රු. 62,060/- රු. 81,660/-
රු. 980/- X 20

(විචල්‍ය ජීවන වියදම් දීමනාව සමග ආසන්න ආරම්භක දළ වැටුප මසකට රු. 154,000/- පමණ වේ)

➢ කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත/නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

➢ බැංකුවේ අවශ්‍යතාව අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

➢ බැංකුවේ අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පිහිටා ඇති ශාඛා වෙත ගමන්කිරීමට හැකිවිය යුතුය.

## තෝරා ගැනීමේ පටිපාටිය

ඉහත දක්වූ යෝග්‍යතා නිර්ණායකයන්ට අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ යාවත්කාලීන කරන ලද ජීවදත්ත පත්‍රිකාව, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් වලට අදාළ සහතික සහ පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලේඛන යනාදියෙහි ඡායාස්ථ පිටපත් සමග ඔබ පිළිබඳව විස්තර ලබාගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත් කර 2024 මැයි මස 11 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කළ තනතුර ද සඳහන් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරානොමැති හෝ අදාළ සනාථකිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවාගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තිය සංවර්ධන)**
**ලංකා බැංකුව**
**26 වන මහල - ප්‍රධාන කාර්යාලය**
**ලංකා බැංකු චතුරශ්‍රය**
**අංක 1, ලංකා බැංකු මාවත,**
**කොළඹ 01.**

- ■ කිසිදු අයුරකින් හෝ බලපෑම් කිරීම වහාම නුසුදුසුභාවයට පත් කිරීමට හේතු වේ.
- ■ තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- ■ සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ අයිතිය බැංකුව සතුය.
- ■ බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

1975 BOC CALL CENTRE
www.boc.lk
A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම.
ප්‍රධාන කාර්යාලය, BOC චතුරශ්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC
ජාතියේ මහා පහන් ටැඹ